**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාවේ පුහුණුව ලැබූ අගමැති ආරක්ෂක අංශයේ නිලධාරීන්ට උපහාර දක්වයි**

අද දින කොළඹදී පැවති විශේෂ උත්සවයකදී ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය 2020 පෙබරවාරි 17 සිට 29 දක්වා ඉන්දියාවේ ප්‍රභූ ජාතික ආරක්ෂක බළකායේ (NSG) සමීප ආරක්ෂණ බලකායේ පුහුණුව ලැබූ අග්‍රාමාත්‍ය ආරක්ෂක අංශයේ නිලධාරීන්ට උපහාර දැක්වීය. සති දෙකක දීර්ඝ පාඨමාලාවක් තුළින් නිළධාරින් 21 දෙනෙකුට සටන් යෝග්‍යතාවය සහ සමීප ආරක්ෂාව / ආසන්න ආරක්ෂාව පිළිබඳ දැඩි සහ පුළුල් පුහුණුවක් ලබා දෙන ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස අතිගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා සහභාගී විය. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් වැඩබලන මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ආරක්ෂක ක්ෂේත්‍රයේ සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කළේය. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ 'කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (SAGAR)' පිළිබඳ දැක්ම අනුව නිර්-අන්තවාදීකරණය, අපරාධ විමර්ශනය, වෝහාරික විද්‍යාව, මූල්‍ය අපරාධ, සයිබර් අපරාධ විමර්ශනය, රථවාහන කළමනාකරණය සහ කාර්මික ආරක්ෂාව වැනි විවිධ ක්ෂේත්‍රයන් යටතේ ශ්‍රී ලංකා පොලිස් සහ නීති නිලධාරීන් සඳහා ඉන්දියාව විසින් පිරිනමන විවිධ කුසලතා වර්ධන වැඩසටහන් පිළිබඳවද වැඩබලන මහ කොමසාරිස් ජේකබ් මැතිතුමා සඳහන් කළේය .

කොළඹ

**2020** මාර්තු **13**